අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2012 අගෝස්තු (නව නිර්දේශය)

**General Certificate of Education (Adv. Level) Examination – August 2012 (New Syllabus)**

# දේශපාලන විද්‍යාව - පැය දෙකයි

# Political Science I – Two hours

**උපදෙස් :**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

- අංක 01 සිට 15 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා තිබෙන ප්‍රකාශ පහ අතුරෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

01. දේශපාලන විද්‍යාව

A - දේශපාලනයේ න්‍යායාත්මක පැත්ත අධ්‍යයනය කරන විෂය හැඳින්වෙන විද්‍යාත්මක නාමය වේ.

B - ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වනුයේ අද හා හෙට දිනයේ උන්නතිය වෙනුවෙන් අතීත දේශපාලන ප්‍රශ්න අධ්‍යයනය කිරීමට ය.

C - සමාජීය විද්‍යා විෂය පවුලට අයත් විෂයයක් වේ.

D - උත්සාහ ගන්නේ මිනිසුන් මිහිපිට ජීවිතයෙන් ගලවා ගැනීමට ය.

E - සමාජීය විද්‍යාවන් අතුරෙන් උසස් ම විද්‍යාව ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

02. දේශපාලනය

A - බල දේශපාලනයේ ප්‍රායෝගික පැත්ත වේ.

B - බලය අල්ලා ගැනීම, රඳවා ගැනීම හා ව්‍යාප්ත කිරීම අරමුණු කොටගෙන ක්‍රියාත්මක වේ.

C - ක්‍රීඩාවක්වන අතර, ප්‍රධාන ක්‍රීඩකයින් වන්නේ දේශපාලන පක්ෂ සහ දේශපාලනඥයින් ය.

D - ගැටුම්කාරී ආශාවන්ගේ, අදහස්වල හා විශ්වාසයන්ගේ අවසාන ප්‍රතිඵලය වේ.

E - සදාචාරාත්මක හා ආගමික අගය කිරීම්වලින් දැඩි ලෙස පාලනය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

03. රාජ්‍යය

A - මිනිසුන් විසින් පිහිටුවා ඇති විවිධ සමාජ සංවිධාන අතුරෙන් එකක් පමණි.

B - දුරවබෝධ දෙයකි.

C - ස්පර්ශ කළ නොහැකි හා අදෘශ්‍යමාන දෙයකි.

D - ස්ථාවර දෙයකි.

E - සම්පූර්ණ දෙයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

04. ආණ්ඩුව

A - සමාජයේ 'පොදු කැමැත්ත' නියෝජනය කරන ඒජන්තවරයා ලෙස සැලකේ.

B - ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යන ආයතන තුනෙන් සමන්විත වේ.

C - ස්පර්ශ කළ හැකි දෘශ්‍යමාන දෙයක් වේ.

D - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ තනි උරුමක්කාරයා වේ.

E - ස්ථාවර දෙයක් නොවන අතර, කාලීන වෙනස් කිරීම්වලට යටත් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

05. ව්‍යවස්ථාදායකය

A - ඒකමණ්ඩල හා ද්විමණ්ඩල වශයෙන් ද්වි ප්‍රභේද වේ.

B - ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන අතුරෙන් විශාලතම ආයතනය වේ.

C - දේශපාලන ක්‍රමයක සුජාතභාවය සහිත නීති නිර්මාණය කරන්නා ලෙස පිළිගනී.

D - රාජ්‍ය මූල්‍ය පිළිබඳ භාරකරුවා වේ.

E - ආණ්ඩුවේ විධායක හා අධිකරණ අංශවලට වඩා පහත් ආයතනයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

06. විධායකය

A - රාජ්‍ය සැලසුම් හා නීති ක්‍රියාවට නැංවීමේ වගකීම හිමි ආණ්ඩු ආයතනය වේ.
B - දේශපාලන සහ ස්ථිර යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.
C - කාර්යයන් ක්‍රියාවට නංවන්නේ පොලීසිය හා රාජ්‍ය සේවය හරහා ය.
D - තම හෘදය සාක්ෂියට හැරුණු විට වෙනත් කිසිවකුට වගකීමට බැඳී නොමැත.
E - ඒකාධිපති, ජනාධිපති හා පාර්ලිමේන්තු වශයෙන් ත්‍රිවිධාකාර වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

07. අධිකරණය

A - නීති පිළිබඳ ව තීරණ ගැනීමේ නිල බලය පැවරුණු ආණ්ඩුවේ තුන්වන අංශය වේ.
B - ස්වාධීන, අපක්ෂපාතී සහ නිර්භය විය යුතු යැයි අපේක්ෂා කෙරේ.
C - විධායකයේ ආශාවන් අනුව ක්‍රියා කළ යුතු යැයි අපේක්ෂා කෙරේ.
D - යුක්තිය හා සාධාරණත්වයේ උත්තරීතර ආරක්ෂකයා ලෙස සැලකේ.
E - අගවිනිසුරු කෙනෙකුගේ නායකත්වය යටතේ පහළ සිට ඉහළට යන උසාවි පද්ධතියක් මත සංවිධානයකර ඇත.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

08. කැබිනට් ආණ්ඩුක්‍රමය

A - බහුවිධ සමාජ ක්‍රමයන්ට වඩාත් සුදුසු වේ.
B - නාමික හා සත්‍ය යනුවෙන් විධායක දෙකකින් යුක්ත වේ.
C - දේශපාලන පක්ෂ පදනම්කරගත් ආණ්ඩු ක්‍රමයක් ලෙස ද සැලකේ.
D - වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී හා වඩාත් වගකීම් සහිත නමුත් කාර්යක්ෂමතාවයෙන් අඩු ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.
E - පක්ෂ මත පදනම් ව ක්‍රියාත්මක වීම නිසා දේශපාලන වශයෙන් අස්ථාවර වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

09. ජනාධිපති ආණ්ඩුක්‍රමය

A - ජනාධිපති නමින් හඳුන්වන තනි විධායකයකින් යුක්ත ය.
B - ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් අඩු වුව ද වඩාත් කාර්යක්ෂම වේ.
C - ශක්තිමත් විධායකය හේතුකොටගෙන දේශපාලන ස්ථාවරභාවය වැඩි ය.
D - බහුපක්ෂ ක්‍රම සහිත රටවල්වලට වඩාත් සුදුසු වේ.
E - ඒකාධිපති ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වනුයේ,

A - තනි බල මධ්‍යස්ථානයක් වෙත ස්වාධිපති බලය ඒකරාශී වීම.
B - ද්විත්ව පුරවැසිභාවය
C - ඒකීය පරිපාලන හා අධිකරණ ක්‍රම පැවතීම.
D - එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පමණක් තිබීම.
E - මධ්‍යම ආණ්ඩුව විසින් අවධාරිත කරන ලද බලය සහිත පළාත් පාලන ආයතන තිබීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. සන්ධීය ආණ්ඩුක්‍රමයක පදනම් මූලධර්ම වනුයේ,

A - දුර්වල මධ්‍යම ආණ්ඩුව හා ශක්තිමත් සන්ධීය ඒකක ආණ්ඩු
B - බල හවුල්කාරිත්වය
C - ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි අනම්‍යභාවය
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා ලෙස ක්‍රියා කරන ස්වාධීන අධිකරණයක් තිබීම.
E - සන්ධීය ඒකකවලට සමාන ව සැලකීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK
EXAMMOOD.LK

12. ධනවාදී ආණ්ඩුවක මූලික ලක්ෂණ වනුයේ,
A - පෞද්ගලික දේපළ හිමිකම පිළිගැනීම.
B - නිදහස් ව්‍යවසාය පිළිගැනීම.
C - විවෘත වෙළඳපොළ ක්‍රමය පිළිගැනීම.
D - ආර්ථිකය පාලනය කිරීම සඳහා රාජ්‍යයේ අවම මැදිහත් වීම.
E - රාජ්‍යය කිසිවක් නොකළ යුතු ය සහ පෞද්ගලික අංශය සියල්ල කළ යුතු ය යන න්‍යාය පිළිගැනීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. සමාජවාදී ආණ්ඩුවක ප්‍රධාන ලක්ෂණ වනුයේ,
A - තනි පක්ෂයක නායකත්වය සහිත දේශපාලන ක්‍රමය
B - පෞද්ගලික දේපළ අයිතිය නොපැවතීම.
C - නිෂ්පාදනය, බෙදාහැරීම හා හුවමාරුව පිළිබඳ රාජ්‍ය ඒකාධිකාරය
D - දේශපාලන නිදහස කැප කිරීම මත ගොඩනැගූ ආර්ථික සමානාත්මතාව
E - ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ගොඩනගා තිබීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. ඒකාධිපති ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වනුයේ,
A - තමන් විසින් ම පත්කර ගත් පාලකයා
B - නීතියට යටත් නොවූ අසහාය පාලනය
C - පාලකයා වගකීමට යටත් නොවීම.
D - නිශ්චිත ආර්ථික හා දේශපාලන දර්ශනයක් මත පාලනය පවත්වා ගෙන යාම.
E - පාලිතයන් මත රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම සඳහා හිංසාකාරී ක්‍රියාමාර්ග භාවිතයට ගැනීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ වනුයේ,
A - ව්‍යවස්ථානුකූල ආණ්ඩුව සහ නීතියේ ආධිපත්‍යය
B - මහජන ස්වාධිපතිත්වය හා පාලකයින් ජනතාවට වගකීම.
C - අධිකරණයේ ස්වාධීනත්වය
D - තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමය හා මාධ්‍ය නිදහස
E - 'සියලු ම මිනිසුන් එක හා සමාන ය, නමුත් සමහර මිනිසුන් අනෙක් අයට වඩා සමාන ය' යන සිද්ධාන්තය පිළිගැනීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

✪ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් එක් ප්‍රකාශයක් වැරදි ය. **වැරදි** ප්‍රකාශය තෝරන්න.

16. බ්‍රිතාන්‍ය දේශපාලන ක්‍රමයේ මූලික ලක්ෂණ වනුයේ,
(1) අලිඛිත ව්‍යවස්ථාව
(2) අසහාය රාජ්‍යත්වය
(3) නීතියේ ආධිපත්‍යය
(4) පාර්ලිමේන්තු ස්වාධිපතිත්වය
(5) සම්ප්‍රදායයන්

17. ඇමරිකානු දේශපාලන ක්‍රමයේ පදනම් මූලධර්ම වනුයේ,
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම විමධ්‍යගත කරන ලද බලය පදනම්කරගත් සන්ධීය ආණ්ඩුක්‍රමය
(2) සිව් අවුරුදු නිල කාලයක් සඳහා ජනතා ඡන්දයෙන් සෘජු ව තෝරා ගන්නා විධායක ජනාධිපති
(3) බලතල බෙදීමේ න්‍යාය සමඟ අනුබද්ධ වූ සංවරණය හා තුලන සිද්ධාන්තය මත ගොඩනැගූ මධ්‍යම ආණ්ඩුව
(4) මණ්ඩල දෙකකින් සමන්විත කොංග්‍රසය නමින් හඳුන්වන ව්‍යවස්ථාදායකය
(5) අධිකරණ විවරණ බලය සහිත ස්වාධීන අධිකරණය

18. ස්විට්සර්ලන්ත ෆෙඩරල් ආණ්ඩුවේ විධායකය
(1) ෆෙඩරල් කවුන්සිලය ලෙස හැඳින්වේ.
(2) සාමාජිකයින් සත් දෙනකුගෙන් සමන්විත වේ.
(3) ෆෙඩරල් සභාව විසින් පත් කරනු ලැබේ.
(4) සාමාජිකයින් සත් දෙනා අතුරෙන් එක් අයෙකු නායකත්වය දරන අතර, ඔහු ජනාධිපති නමින් හැඳින්වේ.
(5) තෝරනු ලබන්නේ ෆෙඩරල් සභාවේ බහුතර පක්ෂයේ

EXAMMOOD.LK
EXAMMOOD.LK

19. ප්‍රංශයේ වර්තමාන ආණ්ඩුක්‍රමය
(1) 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.
(2) පස්වන සමූහාණ්ඩු ක්‍රමය ලෙස හැඳින්වේ.
(3) දෙමුහුන් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්වේ.
(4) ජනාධිපතිවරයා නායකත්වය දරන අතර, ඔහු සත්‍ය විධායකය වේ.
(5) සමාන බලැති විධායකය සහ ව්‍යවස්ථාදායකය යන මූලධර්මය යටතේ ගොඩනගා ඇත.

20. ඉන්දියානු ආණ්ඩුක්‍රමය
(1) අර්ධ සන්ධීය ක්‍රමයකි.
(2) 1950 දී ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇත.
(3) මධ්‍යම ආණ්ඩුවෙන් සහ ප්‍රාන්ත රාජ්‍ය 28 කින් සමන්විත ය.
(4) සත්‍ය විධායක බලතල හිමි ජනාධිපතිවරයා ආණ්ඩුවේ නායකත්වය දරයි.
(5) ක්‍රියාත්මක වන්නේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යයන් අතර බල පංගුකාරිත්වය පදනම්කරගෙන ය.

* අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහෙන් නිවැරදි වන්නේ එක් ප්‍රකාශයක් පමණි. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

21. අන්තර්ජාතික දේශපාලනයේ රඟුම්කරුවන් වන්නේ,
(1) රාජ්‍ය සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ය.
(2) ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ප්‍රංශය, චීනය හා රුසියන් ෆෙඩරේෂනය යන මහ බලවතුන් පස්දෙනා ය.
(3) ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල හා යුරෝපා හවුල ය.
(4) බහුජාතික සමාගම්, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධාන ය.
(5) ස්වාධිපති ජාතික රාජ්‍ය, අන්තර්ජාතික සංවිධාන, බහුජාතික සමාගම් සහ ජාත්‍යන්තර මට්ටමේ වැදගත් පුද්ගලයින් ය.

22. රාජ්‍ය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් කරන්නේ,
(1) ජනතාවගේ පොදු යහපත උදෙසා රාජ්‍ය විසින් සම්පාදනය කොට ක්‍රියාවට නංවන ප්‍රතිපත්ති ය.
(2) දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති ය.
(3) පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල ප්‍රතිපත්ති ය.
(4) රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රතිපත්ති ය.
(5) ආණ්ඩුවේ අමාත්‍යවරුන්ගේ ප්‍රතිපත්ති ය.

23. 'ගැටුම් ත්‍රිකෝණය' පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළේ,
(1) එඩ්වඩ් ඊ. අසාර් ය.
(2) මයිකල් ඊ. බ්‍රවුන් ය.
(3) සැමුවෙල් පී. හන්ටින්ග්ටන් ය.
(4) ජෝන් ගැල්ටුන්ග් ය.
(5) කාල් මාක්ස් ය.

24. ස්වාධිපති බලය යන්නෙන් අදහස් කරන්නේ,
(1) රාජ්‍යයේ බලයයි.
(2) ජනතාවගේ බලයයි.
(3) දෙවියන් වහන්සේගේ බලයයි.
(4) ආණ්ඩුවේ බලයයි.
(5) සිවිල් සමාජයේ බලයයි.

25. බලතල බෙදීම ප්‍රයෝජනවත් වන්නේ,
(1) විධායකයේ බලය සංවරණය කිරීමට ය.
(2) ව්‍යවස්ථාදායකයේ බලය සංවරණය කිරීමට ය.
(3) අධිකරණයේ බලය සංවරණය කිරීමට ය.
(4) ආණ්ඩුවේ බලය සංවරණය කිරීමට ය.
(5) සිවිල් සේවාවේ සහ පොලීසියේ බලය සංවරණය කිරීමට ය.

EXAMMOOD.LK
EXAMMOOD.LK

* අංක 26 සිට 40 දක්වා ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ පහ අතුරෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

26. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය යටතේ ලංකාව තුළ සිදු කළ සමාජ, ආර්ථික හා දේශපාලන වෙනස්කම් කිහිපයක් වන්නේ
   A - අසහාය රාජාණ්ඩු පාලනය අහෝසි කිරීම.
   B - වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම.
   C - කුල ක්‍රමය අහෝසි කිරීම.
   D - වාණිජ වතු වගා ක්‍රමය හඳුන්වා දීම.
   E - බටහිර අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දීම.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

27. 1832 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් ඉදිරිපත් කළ නිර්දේශ වූයේ,
   A - ද්විත්ව පරිපාලන ක්‍රමය අහෝසි කිරීම.
   B - බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමේ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.
   C - ආණ්ඩුකාරයාගේ බලය කප්පාදු කිරීම.
   D - ආණ්ඩුකාරයාට සහාය වීම පිණිස විධායක හා ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම.
   E - ව්‍යවස්ථාදායක සභාවේ එක් සාමාජිකයකු මහජන ඡන්දයෙන් පත් කිරීම.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

28. අධිකරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 1832 දී කැමරන් ඉදිරිපත් කළ නිර්දේශ අතුරෙන් ප්‍රධාන ඒවා වූයේ,
   A - අධිකරණ පරිපාලනය සම්බන්ධයෙන් ආණ්ඩුකාරයා සතු බලය කප්පාදු නොකළ යුතු වීම.
   B - ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය සමස්ත දිවයිනට ම බලපාන අයුරින් පුළුල් කළ යුතු වීම.
   C - දිස්ත්‍රික්කයකට එකක් වන සේ සෑම දිස්ත්‍රික්කයක ම දිස්ත්‍රික් උසාවි පිහිටුවිය යුතු වීම.
   D - දිස්ත්‍රික් උසාවිවලට පූර්ණ සිවිල් අධිකරණ බලය ද සීමිත අපරාධ අධිකරණ බලය ද පැවරිය යුතු වීම.
   E - යුරෝපීයයන් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියාත්මක කළ වෙන ම සිවිල් අධිකරණ බලය අහෝසි කළ යුතු වීම.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

29. 1910 - 1924 කාලය තුළ ක්‍රියාවට නැංවූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ,
   A - ව්‍යවස්ථාදායක සභාවේ නියෝජිත පදනම පුළුල් කරන ලදී.
   B - ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික සංඛ්‍යාව අනුක්‍රමයෙන් වැඩි කරන ලදී.
   C - ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාස යටතේ තෝරා පත් කළ නියෝජිත සංඛ්‍යාව වැඩි කරන ලදී.
   D - ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජිකයන්ගේ බලය වැඩි කරන ලදී.
   E - ව්‍යවස්ථාදායක සභාවේ වාර්ගික නියෝජනය මුළුමනින් ම අහෝසි කරන ලදී.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

30. ලංකා ජාතික සංගමය
   A - 1919 දී පිහිටුවිය.
   B - වාර්ගික හා ප්‍රාදේශික කණ්ඩායම් කිහිපයක එකතුවක් විය.
   C - අභ්‍යන්තර බෙදීම් හේතුකොටගෙන ශක්තිමත් සංවිධානයක් නොවී ය.
   D - සමාජයේ සෑම ආර්ථික හා සමාජ කණ්ඩායමක් ම එක්තැන් වූ ජනතා ව්‍යාපාරයක් විය.
   E - ඉංග්‍රීසි භාෂාව උගත් ධනවත් මධ්‍යම පාන්තිකයන් නායකත්වය දැරූ ව්‍යාපාරයක් විය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

31. ලංකා සමසමාජ පක්ෂය
   A - 1935 වර්ෂයේ දී පිහිටුවන ලදී.
   B - ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ප්‍රථම වාමාංශික පක්ෂය විය.
   C - මාක්ස්වාදය වැලඳගත් බටහිර අධ්‍යාපනය ලැබූ තරුණ රැඩිකල් කණ්ඩායමක් විසින් පිහිටුවන ලදී.
   D - ආරම්භයේ දී සංවිධානය කළේ ලෙනින්වාදී පක්ෂයක් ලෙස ය.
   E - ලංකාව තුළ සමාජවාදී ආණ්ඩුක්‍රමයක් ගොඩනැගීම අරමුණුකොට ගත්තේ ය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK
EXAMMOOD.LK

32. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් යෝජනා කළේ,

A - විධායක හා ව්‍යවස්ථාදායක යන ද්විත්ව කාර්යයන් ම පැවරුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවක් පිහිටුවීම.
B - සර්වජන ඡන්ද බලය ලබා දීම.
C - විධායක කාරක සභා සභාපතිවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලයක් පිහිටුවීම.
D - රාජ්‍ය නිලධාරීන් සහ කථානායකවරයා හැර රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනෙක් සෙසු මන්ත්‍රීවරුන් ඇතුළත් වන පරිදි විධායක කාරක සභා හතක් පිහිටුවීම.
E - මුදල්, රාජ්‍ය සේවය හා නීති කටයුතු භාර ව රාජ්‍ය නිලධාරීන් තිදෙනකු පත් කිරීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

33. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

A - වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ඉල්ලා සිටීම සඳහා ලංකාව පුරුදු පුහුණු කළේ ය.
B - පරිපාලනය පිළිබඳ ව දේශපාලනඥයින්ට පුහුණුව ලබා දුන්නේ ය.
C - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය දුර්වල කිරීම සඳහා විශාල ලෙස දායක විය.
D - වගකීම් සහිත ආණ්ඩුවක් ලබා ගැනීමේ සටනට වේදිකාවක් සපයා දුන්නේ ය.
E - නියෝජන ආණ්ඩුක්‍රමය හා වගකීමේ ආණ්ඩුක්‍රමය යන දෙක අතර කලින් පැවතියා වූ අප්‍රසන්න පරතරය නැති කළේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

34. 1948 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

A - බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය මගින් ලංකාවට හඳුන්වා දුන් අවසාන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය විය.
B - බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය තුළ සාමාජිකත්වය සහිත ව ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කළේ ය.
C - බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ආකෘතිය පදනම්කරගත් කැබිනට් ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන්නේ ය.
D - බ්‍රිතාන්‍ය රජන ලංකාවේ රාජ්‍යය නායකයා ලෙස පත් කිරීම මගින් යටත් විජිත සම්බන්ධතා තවදුරටත් පවත්වා ගෙන යාමට ක්‍රියා කළේ ය.
E - ලංකාව වෙනුවෙන් නීති පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව භුක්ති වින්ද බලය මුළුමනින් ම අහෝසි කළේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

35. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ කැබිනට් මණ්ඩලය

A - පහළ මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදී.
B - අගමැතිවරයා විසින් තීරණය කරන ලද සංඛ්‍යාවකින් සමන්විත විය.
C - පාර්ලිමේන්තුවට සාමූහික ව වගකිව යුතු විය.
D - බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් අනුගමනය කිරීම අපේක්ෂා කළේ ය.
E - ආණ්ඩුවේ සත්‍ය විධායක බලතල පැවරිණි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

36. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ,

A - ලංකාව යනුවෙන් භාවිත කළ රටේ නිල නාමය ශ්‍රී ලංකාව ලෙස වෙනස් කළේ ය.
B - ශ්‍රී ලංකාව නිදහස්, ස්වාධිපති හා ස්වෛරී සමූහාණ්ඩුවක් බවට පත් කළේ ය.
C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ මූලික නීතිය ලෙස ස්ථාපිත කළේ ය.
D - ශ්‍රී ලංකා ජනරජයේ ස්වාධිපති බලය ජනතාව වෙත පිහිටුවීය.
E - ජනතා පරමාධිපත්‍යය ජනතාව විසින් මැතිවරණ හරහා ක්‍රියාවට නංවන පරිදි ජනතාව සවිබල ගැන්වීය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

37. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේ දී භාවිතයට ගත් දේශපාලන න්‍යායයන් වන්නේ,

A - බලතල බෙදීමේ න්‍යාය
B - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය
C - සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය
D - මහජන ස්වාධිපති න්‍යාය
E - සාමූහික වගකීමේ න්‍යාය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK

38. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන් නව දේශපාලන ආයතන කිහිපයක් වන්නේ,

A - විධායක ජනාධිපති ක්‍රමය
B - ද්විත්ව විධායක ක්‍රමය
C - ඔම්බුඩ්ස්මන්
D - පළාත් සභා ක්‍රමය
E - අධිකරණ සේවා කොමිසම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපතිත්වය ජනතාව කෙරෙහි පිහිටා ඇති අතර, ජනතාව තම පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන මාර්ග වන්නේ,

A - ව්‍යවස්ථාදායක බලය - පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයේ දී ජනතාව විසින්
B - විධායක බලය - ජනතා ඡන්දයෙන් පත් කළ ජනාධිපතිවරයා විසින්
C - අධිකරණ බලය - උසාවි හා වෙනත් අධිකරණ ආයතන හරහා පාර්ලිමේන්තුව විසින්
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතිකකර ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳීම මගින්
E - අවුරුදු 18 සපිරූ සෑම අයකුට ම හිමිවන ඡන්ද බලය මගින්

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

40. 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය

A - මූලික නීතිය මගින් පිහිටුවා ඇත.
B - අග්‍රවිනිශ්චයකරු සහ වෙනත් විනිශ්චයකරුවන් 6 - 10 දක්වා ප්‍රමාණයකින් සමන්විත වේ.
C - සිවිල් සහ අපරාධ අභියාචනා අධිකරණ බලය හිමි අවසාන උසාවිය වේ.
D - මානව හිමිකම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් තනි හා අනන්‍ය අධිකරණ බලය භුක්ති විඳියි.
E - සමහර අවස්ථානුකූල තත්ත්වයන් යටතේ ස්වකීය අධිකරණ බලය අනෙක් උසාවිවලට පවරා දිය හැක.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

✪ අංක 41 සිට 46 දක්වා ප්‍රශ්නවලට සපයා ඇති ප්‍රකාශ පහෙන් හතරක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

41. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය සමන්විත වන්නේ,

A - ශ්‍රේෂ්ඨාධිකරණය සහ මානව හිමිකම් කොමිසම
B - ශ්‍රේෂ්ඨාධිකරණය සහ ඔම්බුඩ්ස්මන්
C - මානව හිමිකම් කොමිසම සහ ඔම්බුඩ්ස්මන්
D - ශ්‍රේෂ්ඨාධිකරණය, මානව හිමිකම් කොමිසම සහ ඔම්බුඩ්ස්මන්
E - ශ්‍රේෂ්ඨාධිකරණය, පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව, ඔම්බුඩ්ස්මන් සහ මානව හිමිකම් කොමිසම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

42. පාර්ලිමේන්තු වරප්‍රසාද

A - සාමූහික වශයෙන් පාර්ලිමේන්තුවේ ද, පෞද්ගලික වශයෙන් මන්ත්‍රීවරුන්ගේ ද ගෞරවය, බල අධිකාරිය හා ස්වාධීනත්වය ආරක්ෂා කරන නීති වේ.
B - පාර්ලිමේන්තුවේ ගෞරවය, බල අධිකාරිය හා ස්වාධීනත්වය ආරක්ෂා කරන නීති වේ.
C - කථානායකගේ ගෞරවය, බල අධිකාරිය හා ස්වාධීනත්වය ආරක්ෂා කරන නීති වේ.
D - පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ ගෞරවය, බල අධිකාරිය හා ස්වාධීනත්වය ආරක්ෂා කරන නීති වේ.
E - මන්ත්‍රීවරුන්ගේ ගෞරවය, බල අධිකාරිය හා ස්වාධීනත්වය ආරක්ෂා කරන නීති වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK

43. පළාත් සභා ආණ්ඩුකාරයා
   A - පළාත් මහ ඇමති විසින් පත් කරනු ලැබේ.
   B - පළාතේ මහ ඇමතිගේ උපදෙස් අනුව ජනාධිපති විසින් පත් කරනු ලැබේ.
   C - පළාත් සභාවේ විධායකයේ කොටසක් වේ.
   D - විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු ය.
   E - පළාත තුළ විධායක බලය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පළාත් සභාවට ද වගකිව යුතු ය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

44. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනතාව සතු ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නංවන්නේ,
   A - ජනාධිපති සහ පාර්ලිමේන්තුව විසිනි.
   B - පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන විසිනි.
   C - පාර්ලිමේන්තුව විසිනි.
   D - පාර්ලිමේන්තුව, ජනාධිපති සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි.
   E - ජනතාව විසින් තෝරා පත් කළ නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයක දී සෘජු ව ම ජනතාව විසිනි.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

45. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මූලික ලක්ෂණය
   A - බහුපක්ෂ ක්‍රමයකි.
   B - ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් විසින් නායකත්වය දරන බහුපක්ෂ ක්‍රමයකි.
   C - වාර්ගික, ආගමික හා භාෂා යන කරුණු මත සංවිධානය වූ බහුපක්ෂ ක්‍රමයකි.
   D - ප්‍රධාන පක්ෂ තුනක් යටතේ කණ්ඩායම් ලෙස සංවිධානය වූ බහුපක්ෂ ක්‍රමයකි.
   E - කේඩර දේශපාලන පක්ෂවලින් පමණක් සමන්විත බහුපක්ෂ ක්‍රමයකි.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

46. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන
   A - මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන ආයතන තුන් වර්ගයෙන් සමන්විත වේ.
   B - තෝරා පත් කරන හා නාමකරණයෙන් පත් කරන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.
   C - දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණයට යටත් වේ.
   D - අදාළ බල ප්‍රදේශය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ වගකීම දරනු ලැබේ.
   E - මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතායතන වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

✪ පහත දැක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයට අදාළ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ ඇසුරින් අංක **47** සහ **48** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   A - වර්තමාන ලෝකය තුළ ඇති පුළුල් අරමුණු සහිත විශාල ම අන්තර් රාජ්‍ය සංවිධානය වේ.
   B - සීමිත අරමුණු සහිත කලාපීය අන්තර් රාජ්‍ය සංවිධානයක් වේ.
   C - අන්තර්ජාතික සංවිධාන පිළිබඳ සැන්ප්‍රැන්සිස්කෝ සම්මේලනයට සහභාගී වූ රටවල් 50 ක නියෝජිතයින්ගේ අනුමැතියෙන් ස්ථාපිත කළ ප්‍රඥප්තිය පදනම්කරගෙන 1945 දී පිහිටුවන ලදී.
   D - අන්තර්ජාතික සාමය හා සුරක්ෂිතතාව තහවුරුකොට පවත්වාගෙන යාම ප්‍රධාන අරමුණ වේ.
   E - ඪකා ප්‍රකාශනය පදනම්කරගෙන 1985 දෙසැම්බර් 8 දින පිහිටුවනු ලැබී ය.
   F - සාමාජික රාජ්‍යයන් අතර දේශපාලන හා මිලිටරි සහයෝගිතාව වර්ධනය කිරීම ප්‍රධාන අරමුණ වේ.
   G - සාමාජික රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවිය යුතු ය යන ප්‍රතිපත්තිය මත ක්‍රියාත්මක වේ.
   H - ද්විපාර්ශ්වික සහ අර්බුදකාරී කරුණු සාකච්ඡා නොකළ යුතු බව සාමාජික රාජ්‍යයන් පොදුවේ පිළිගෙන ඇත.
   I - කොමියුනිස්ට් විරෝධී වීම කැපී පෙනෙන ලක්ෂණය වේ.
   J - සාමාජිකයින් අතර පවතින අභ්‍යන්තරික ගැටුම් හේතුකොටගෙන ප්‍රගතිය විශාල වශයෙන් දුර්වල වී ඇත.

47. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   (1) ABCD (2) ACDG (3) AEFG (4) AHIJ (5) BDGH

EXAMMOOD.LK
EXAMMOOD.LK

48. කලාපීය සහයෝගීතාව සඳහා වූ කරුණු ආසියාතික සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) ACFH (2) BGIJ (3) BEHJ (4) DEHI (5) GHIJ

❂ පහත දක්වා ඇත්තේ පොදුරාජ්‍ය මණ්ඩලය සහ අන්තර්ජාතික රතු කුරුස කමිටුව හා අදාළ වන ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ අදාළකරගෙන අංක **49** සහ **50** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සීමිත අරමුණු සහිත මැදි මට්ටමේ අන්තර් රාජ්‍ය සංවිධානයකි.
B - සීමිත අරමුණු සහිත මැදි මට්ටමේ රාජ්‍ය නොවන සංවිධානයකි.
C - සාමාජිකයින් විය හැක්කේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයින්ට පමණි.
D - බ්‍රිතාන්‍ය මහ රැජින නායකත්වය දරයි.
E - සැලකිලිමත් වන්නේ සාමාජික රාජ්‍යයන්හි සමාජ, ආර්ථික හා දේශපාලන සංවර්ධනය පිළිබඳ ව ය.
F - සාමාජික බහුතරය පැරණි බ්‍රිතාන්‍ය යටත් විජිත වේ.
G - යුද්ධ සංග්‍රාම භූමි තුළ අන්තර්ජාතික මානව හිතවාදී නීතිය ක්‍රියාත්මක වීම ගැන ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වේ.
H - ලෝකය පුරා පිහිටුවා ඇති ජාතික රතු කුරුස සංවිධාන සහ රතු අඩසඳ සමාජ ජාලය හරහා වැඩකටයුතු ක්‍රියාවට නැංවේ.
I - අන්තර්ජාතික මානව හිතවාදී නීතියේ ආරක්ෂකයා සහ ප්‍රවර්ධකයා ලෙස විශ්ව ප්‍රජාව විසින් පිළිගෙන ඇත.
J - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අධීක්ෂණයට යටත් ව ක්‍රියාත්මක වේ.

49. පොදුරාජ්‍ය මණ්ඩලයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) ACDH (2) BFHI (3) DEIJ (4) CEJI (5) ADEF

50. අන්තර්ජාතික රතු කුරුස කමිටුවට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) AHIJ (2) ABEJ (3) GDHI (4) BGHI (5) GHIL

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2012 අගෝස්තු (නව නිර්දේශය)

**General Certificate of Education (Adv. Level) Examination – August 2012 (New Syllabus)**

දේශපාලන විද්‍යාව **II** - පැය තුනයි

**Political Science II – Three hours**

**උපදෙස් :**

- මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් තුනකින් යුක්ත ය.
- **A** කොටස තුළ කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු 01 ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු ½ ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා B හා C කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- B හා C කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

01. "රාජ්‍යය සමාජ සංවිධානයකි."
"රාජ්‍යය පංති ආයුධයකි."
රාජ්‍යය පිළිබඳ ව මෙම අර්ථකථන දෙක සැපයූ දේශපාලන විද්‍යා ගුරුකුල **දෙක** නම් කරන්න.
1. ..........
2. ..........

02. "සමාජ සම්මුතිවාදය ගොඩනගා තිබෙන්නේ සමාජ ක්‍රම දෙකක් පදනම්කරගෙන ය." මෙම සමාජ ක්‍රම **දෙක** නම් කරන්න.
1. ..........
2. ..........

03. "බලය මගින් මිනිසා දූෂණය වේ. අධික බලයෙන් අධික ලෙස දූෂණය වේ."
"නිරන්තර අත්දැකීම් මගින් අපට පෙන්වා දෙන්නේ බලය හිමි වී ඇති සෑම මිනිසෙක් ම එම බලයට සීමා පනවන තුරු බලය අයථා ලෙස යෙදීමට පෙළඹෙන බව සහ බලය පවත්වා ගෙන යාමට උත්සාහ කරන බව ය."
බලය පිළිබඳ ව ඉහත දැක්වූ ප්‍රකාශ දෙක ඉදිරිපත් කළ දේශපාලන දාර්ශනිකයින් **දෙදෙනා** නම් කරන්න.
1. ..........
2. ..........

04. "සිවිල් ආණ්ඩුව පිළිබඳ සම්මුතීන් දෙකක්" සහ "දාස් කැපිටාල්" (ජාතීන්ගේ ධනය) කෘතීන් දෙකේ කර්තෘවරුන් **දෙදෙනා** නම් කරන්න.
1. ..........
2. ..........

05. "රාජ්‍යයේ බලය විමධ්‍යගත කිරීම සහ සංකේන්ද්‍රණය කිරීම පදනම්කරගෙන ආණ්ඩුක්‍රම වර්ග දෙකකට බෙදනු ලැබේ." මෙම වර්ග **දෙක** නම් කරන්න.
1. ..........
2. ..........

06. * බලතල බෙදීම.
* පාර්ලිමේන්තු ස්වාධිපතිත්වය
* දේශපාලන සංකේත
* අධිකරණ විවරණ බලය

ඉහත දක්වා ඇති විධික්‍රම අතුරෙන් ආණ්ඩුවේ බලය සංවරණය කිරීම සඳහා යොදාගත හැකි විධික්‍රම **දෙක** නම් කරන්න.
1. ..........
2. ..........

07. "කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායකය කොටස් දෙකකින් සමන්විත වේ." එම කොටස් **දෙක** නම් කරන්න.
1. ..........
2. ..........

08. "කොංග්‍රස් මණ්ඩලය නමින් හැඳින්වෙන ඇමරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ මණ්ඩල දෙකකිනි." එම මණ්ඩල **දෙක** නම් කරන්න.
1. ..........

EXAMMOOD.LK EXAMMOOD.LK

09. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලය සමන්විත වන්නේ සාමාජිකයින් වර්ග දෙකකිනි. එම වර්ග **දෙක** නම්කොට ඒ ඒ වර්ගයට අයත් සාමාජික සංඛ්‍යාව සඳහන් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

10. "රාජ්‍ය ප්‍රතිපත්ති චක්‍රය අවධි සයකින් සමන්විත වේ." එයින් අවධි **දෙකක්** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

11. "1796 සිට 1833 දක්වා ලංකාවේ මුහුදු බඩ දිස්ත්‍රික්ක පැවතුණේ ද්විත්ව පරිපාලනයක් යටතේ ය." ද්විත්ව පරිපාලනයේ කොටස් **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

12. "1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ පරිපාලන කාර්යයන් සඳහා ආණ්ඩුකරුට සහාය වීම පිණිස ආණ්ඩුක්‍රම ආයතන දෙකක් පිහිටුවී ය." එම ආයතන **දෙක** හා ඒවායේ සංයුතිය දක්වන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

13. "ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිට වූ රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් එකිනෙකට වෙනස් කාර්යයන් ද්විත්වයක් ඉටු කළේ ය." එම කාර්යයන් **ද්විත්වය** දක්වන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

14. "සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායකය සමන්විත වූයේ මණ්ඩල දෙකකිනි." එම මණ්ඩල **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

15. රාජ්‍ය සේවය පාලනය කිරීම සඳහා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ මණ්ඩල **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

16. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ 18 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිට වූ පාර්ලිමේන්තු සභාවේ සංයුතිය දක්වන්න.

..............................................................................................................................
..............................................................................................................................

17. කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයේ තීරණ ගැනීමේ ඉහළ ම ආයතන **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීම සහ තහනම් ආඥා නිකුත් කිරීම පිළිබඳ අධිකරණ බලය හිමිකර දෙමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ අධිකරණ **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

19. පළාත් සභාවලට බලය විමධ්‍යගත කිරීම සඳහා සහ පළාත් පාලන ආයතනවලට බලය අවධාරිත කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතකර ඇති විධික්‍රම **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

20. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා එම ව්‍යවස්ථාව මගින් දක්වා තිබෙන විධි ක්‍රම **දෙක** නම් කරන්න.

1. ..............................................................................................................................
2. ..............................................................................................................................

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK

අ. පො. ස. (උසස් පෙළ) විභාගය - 2012 අගෝස්තු (නව නිර්දේශය)

දේශපාලන විද්‍යාව - II

ප්‍රශ්න පත්‍රය

**උපදෙස් :-** **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

01. "දේශපාලන විද්‍යාව ගතික විෂයක් වේ. එහි විෂය ක්ෂේත්‍රය දෛනිකව ම වර්ධනය වේ." ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. **(ලකුණු** 20 **යි.)**

02. යහපත් හා අයහපත් ලක්ෂණවලට අවධානය යොමු කරමින් පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
    (i) නම්‍ය හා අනම්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
    (ii) බලතල බෙදීම.
    (iii) සමානුපාතික නියෝජන ක්‍රමය
    (iv) අධිකරණ විවරණ බලය
    (v) ජනාධිපති ආණ්ඩුක්‍රම සහ කැබිනට් ආණ්ඩුක්‍රම **(ලකුණු** 10 × 2 = 20 **යි.)**

03. පහත දැක්වෙන ඒවා විභාග කරන්න.
    (i) ආණ්ඩුව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද සහ එහි කාර්යයන් මොනවාද යන්න
    (ii) ආණ්ඩුවේ බලය සහ ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ විධික්‍රම **(ලකුණු** 10 × 2 = 20 **යි.)**

04. පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
    (i) ඇමරිකානු ආණ්ඩුක්‍රමය තුළ විධායක - ව්‍යවස්ථාදායක සම්බන්ධතාව
    (ii) ප්‍රංශ ආණ්ඩුක්‍රමය තුළ විධායක - ව්‍යවස්ථාදායක සම්බන්ධතාව
    (iii) ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ සන්ධීය මූලධර්ම
    (iv) ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය තුළ සාමූහික විධායකය
    (v) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ කිරීටයේ ක්‍රියා කලාපය **(ලකුණු** 10 × 2 = 20 **යි.)**

## C කොටස

05. "1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් ලංකාව තුළ පැරණි යුගයේ අවසානය මෙන් ම නව යුගයක ආරම්භය සනිටුහන් කළේ ය." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. **(ලකුණු** 20 **යි.)**

06. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ආශ්‍රිත ව පහත දැක්වෙන ඒවා විභාග කරන්න.
    (i) අමාත්‍ය මණ්ඩලය හා එහි කාර්යයන්
    (ii) විධායක කාරක සභා ක්‍රමය **(ලකුණු** 10 × 2 = 20 **යි.)**

07. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පහත දැක්වෙන ඒවා විභාග කරන්න.
    (i) නාමික විධායකයේ තත්වය හා බලතල
    (ii) පාර්ලිමේන්තුවේ සංයුතිය හා බලතල **(ලකුණු** 10 × 2 = 20 **යි.)**

08. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ තත්ත්වය, බලතල හා කාර්යයන් විභාග කරන්න. **(ලකුණු** 20 **යි.)**

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK